// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2159/45 - 2020 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2020.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/10/04/2013

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.01.04 දිනැති හා අංක 2000/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.12.29 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් රඹුක්කන, දොඹේමඩ, කුඩාගම, කෝන්ගහවත්ත හි පදිංචි එස්. සී. එල්. කේ. වික්‍රමරත්න මයා සහ කොළඹ 05, තැ. පෙ. 807, කම්කරු මහලේකම් කාර්යාලය, 1 වන මහල හි පිහිටි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.01.02 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,<br>
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 18 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

IR/10/04/2013

කාර්මික අධිකරණයේදී ය.

එස්. සී. එල්. කේ. වික්‍රමරත්න,<br>
කෝන්ගහවත්ත,<br>
කුඩාගම,<br>
දොඹේමඩ,<br>
රඹුක්කන.

*(ඉල්ලුම්කාර පළමු පාර්ශවය)*

නඩු අංකය : A/02/2017

*එදිරිව*

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය,<br>
1 වන මහල,<br>
කම්කරු මහලේකම් කාර්යාලය,<br>
තැ.පෙ. 807,<br>
කොළඹ 05.

*(වගඋත්තරකාර දෙවන පාර්ශවය)*

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමාගේ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016.12.29 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් දෙපාර්ශවය අතර ඇති කාර්මික ආරවුලට හේතු වී ඇත්තේ "සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ II වන ශ්‍රේණියේ කළමණාකරුවකු ලෙස වැඩබලන පදනම යටතේ සේවය කරන එස්. සී. එල්. කේ. වික්‍රමරත්න මහතාට ලබා දී ඇති පත්වීම 2009.05.01 දින සිට ස්ථිර පදනම මත ක්‍රියාත්මක වන පරිදි පසුදාතම නොකිරීම යුක්ති සහගත ද යන්න හා එසේ නොවේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ." දෙපාර්ශ්වය විසින් ඔවුනනොවුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කර හුවමාරු කර ගැනීමෙන් පසුව ඉල්ලුම්කරු වෙනුවෙන් නීතිඥ නලින් ආර් පෙරේරා මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර දෙවන පාර්ශවය වෙනුවෙන් සහකාර සාමාන්‍යාධිකාරි (පරිපාලන හා මානව සම්පත්) සමන්මලී රූපසිංහ මහත්මිය පෙනී සිටින ලදී.

2017.07.03 වැනි දින නඩු විභාගය ආරම්භ කර 2017.07.21 වැනි දිනට කල් තබා නැවත 2017.07.31 වැනි දින, ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥ පෙනී සිටීමක් නොමැතිව නඩුව ආරම්භ කළ අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශවය පෙනී සිටියදී කියා සිටියේ මහජන පෙත්සම් කාරක සභා අංශයේ 2017.06.28 වැනි දින පැවැති පරීක්ෂණයේදී උසස්වීම පසුදාතම කොට දීමට දෙවන පාර්ශවයට නියෝගයක් ලබා දෙන ලද බැවින් එම නියෝගය ලිඛිතව ඉදිරිපත් කරන තෙක් නඩු විභාගය කල් තැබීමට ඉල්ලුම් කරන ලදී.

2017.06.28 වැනි දින මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා අංශයේ පැවැත් වූ පරීක්ෂණයට අනුව වැටුප් වැඩිවීම, සැකසීම පිළිබඳ ප්‍රශ්නය මත නඩුව විභාගය දිනයන් කිහිපයක් ගත වූ පසු 2018.05.03 පැවැති විභාගයේදී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් කියා සිටියේ 2017.08.07 වැනි දින පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභා ලේකම් දැනුම් දුන් පරිදි 2011.03.11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්කරුව කළමනාකාර තනතුරේ පිහිටුවා ඇති බවයි. එසේම චක්‍රලේඛවලට අනුව වැටුප් තලයේ තබා වැටුප සකස් කර ඇති බවත් දන්වන ලදී.

තවදුරටත් වගඋත්තරකාර පාර්ශවය කියා සිටියේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී එකඟ වූ පරිදි මෙම කරුණ සම්බන්ධව කම්කරු කොමසාරිස් හෝ වෙනත් ආයතනයක් වෙත අභියාචනයක් හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන ඇත්නම් ඉහත සඳහන් සහනයන් ලැබුණු පසු එම පැමිණිලි ඉල්ලා අස්කර ගන්නා ලෙස දන්වා ඇති බවයි.

ඉල්ලුම්කරු පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාවේ ලබා දී ඇති නිර්දේශ පිළිගන්නා බවත් පැමිණිල්ලේ කටයුතු අවසන් කර ගැනීමට එකඟ වූ අතර නිවැරදි වැටුප් සම්බන්ධව සේවා ආයතනයට අදළ රේඛීය අමාත්‍යාංශය හරහා විසඳා ගන්නා බවද දන්වා සිටින ලදී. වැටුප් සම්බන්ධ පොදු ප්‍රතිපත්ති මත මෙම වැටුප් විෂමතාවයක් වී ඇත්දැයි සොයා බලන ලෙස සේවක භාරකාර අරමුදල් මණ්ඩලයට දන්වා සිටීමටත් මෙහි පිටපත් මහජන පෙත්සම් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට යැවීමට පිටපත් නිකුත් කරන මෙන් දන්වන ලදී. ඉල්ලුම්කරුගේ ඉල්ලීම දැනටමත් ලබා දී ඇති බැවින් නඩු කටයුතු අවසන් කරමි.

බේරුම්කරු,
ආර්. එස්. ආරියප්පෙරුම.
2020.01.02.

02-154

---

*මගේ අංකය* : IR/15/11/2011

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.02.03 දිනැති හා අංක 1952/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.01.28 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කහව, දුම්රිය ස්ථානය ඉදිරිපිට, "සිසිලස", සිසිර ද සිල්වා මයා සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.12.03 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය* : IR/15/11/2011

කාර්මික අධිකරණයේදී ය.

සිසිර ද සිල්වා මහතා,
"සිසිලස",
දුම්රිය ස්ථානය ඉදිරිපිට,
කහව.

*පළමු පාර්ශවය*

නඩු අංකය : A 3624

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී. බී. ජයා මාවත,
කොළඹ.

*දෙවන පාර්ශවය*

අතර පවතින කාර්මික ආරවුල

## ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) පනත්වලින් සංශෝධනය වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2016.01.28 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

### ආරවුලට හේතු වී ඇති කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

"ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමියෙකු වශයෙන් සේවයේ යෙදෙමින් සිටි සිසිර ද සිල්වා මහතා හට අවුරුදු හැට (60) දක්වා සේවය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබියදීත්, ආයතනය විසින් ඔහුට අවුරුදු පනස් අටයි මාස තුනයි දින එකොළහකදී විශ්‍රාම ගැන්වීම යුක්ති සහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳ වේ."

### බේරුම්කරණ විභාගයේදී පසුබිම සහ එය පැවැත්වූ ආකාරය

මෙම කාර්මික ආරවුලට අදාල පරීක්ෂණය යොමු කිරීම් දෙකක් යටතේ අවස්ථා දෙකකදී පහත සඳහන් බේරුම්කරුවන් දෙදෙනා විසින් විභාග කරනු ලැබූවකි.

1. බේරුම්කරු ඩබ්ලිව්. ජී. ඩීන් මහතා - අංක A3624 යටතේ
2. බේරුම්කරු එස්. විරිතමුල්ල මහතා - අංක A3504 යටතේ

අංක IR/15/11/2011 යටතේ යොමු කරනු ලැබූ අංක A3624 වූ පළමු නඩුව බේරුම්කරු ඩබ්ලිව්. ජී. ඩීන් මහතා ඉදිරියේ පළමු සහ දෙවන ප්‍රකාශ දෙපාර්ශවයන් විසින් ඉදිරිපත් කිරීමෙන් පසු ව 2013.10.01 දින මුල්වරට බේරුම්කරණ විනිශ්චයාධිකාරිය රැස් වී ඇත. ඉන්පසුව 2013.11.26, 2014.01.30, 2014.03.04, 2014.04.07, 2014.05.29, 2014.06.30, 2014.08.04, 2014.08.21 යන දිනයන්හි දී ඩබ්ලිව්. ජී. ඩීන් මහතා විසින් බේරුම්කරණ විභාගය පවත්වා සාක්ෂි විභාගය අවසන් කර ඇත. පරීක්ෂණය සඳහා දින නියම කරනු ලැබුවද 2014.05.05 වැනි දින බේරුම්කරණ විභාගය පැවැත්වී නැත. අනතුරුව දෙපාර්ශවය විසින් ම අවසන් ලිඛිත සැලකිරීම් ද ගොනු කර ඇත.

එසේ බේරුම්කරණ විභාගයේ සියලු කටයුතු අවසන් වීමෙන් පසු ව ප්‍රදානය නිකුත් කිරීමට පෙර එම බේරුම්කරණයේ බේරුම්කරු වශයෙන් පත් කර තිබුණු ඩබ්. ජී. ඩීන් මහතා අසනීප වීමේ හේතුවෙන් යොමුවෙන් ඉවත් වී ඇත.

ඒ නිසා ඩීන් මහතා වෙත කර තිබූ යොමුව අවලංගු කොට යොමු අංක IR/15/11/2011 යටතේම 2018.01.28 වැනි දිනැති නියෝගය මගින් එවකට සිටි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් එකී යොමුවේ සඳහන් කාර්මික ආරවුල විසඳීමට මා වෙත යොමු කරනු ලැබ ඇත.

බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා මා වෙත යොමු කරන ලද එකී කාර්මික ආරවුලට හේතු වී ඇති කරුණ ද එකහෙලා ම පෙර පරිදි විය. ඒ අනුව දෙපාර්ශවයේ ප්‍රකාශ කැඳවා බේරුම්කරණ විභාගය සඳහා 2016.05.30 වැනි දින පාර්ශවයන් කැඳවන ලදී. එහි දී පළමු වන පාර්ශවයේ ඉල්ලුම්කරු සිසිර ද සිල්වා මහතා පැමිණ සිටි අතර ඔහු වෙනුවෙන් නීතිඥවරයෙකු හෝ නියෝජිතවරයෙකු පෙනී සිටියේ නැත.

එදින දෙවන පාර්ශවයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නියෝජනය කරමින් නීතිඥ අයේෂා කොලොන්නේ මහත්මිය පෙනී සිටියාය.

බේරුම්කරණ විභාගය ආරම්භයේ දී ම පළමු වන පාර්ශවයත්, දෙවන පාර්ශවයත් එක හෙලාම සහ නොපැකිලි ව ප්‍රකාශ කර සිටියේ මෙහි සාක්ෂි විභාගය දැනට මත් අවසන් කර ඇති බැවින් නැවත සාක්ෂි විභාගය කිරීම අනවශ්‍ය බව ය. ඒ අනුව ඔවුන්ගේ වාචික සැළකිරීම් වාර්තා කරමින් මා වෙතින් ඉල්ලා සිටියේ බේරුම්කරු ඩබ්. ජී. ඩීන් මහතා විසින් මෙහෙයවන ලද සාක්ෂි විභාගයේ සටහන් සහ දෙපාර්ශවය විසින් ම ගොනු කර ඇති අවසන් ලිඛිත සැලකිරීම් ද පදනම් කර ගෙන ප්‍රදානයක් ලබා දෙන ලෙස ය. ඒ අවස්ථාවේ දී එම ඉල්ලීම පිළිගත් අතර නව බේරුම්කරු වශයෙන් මා ඉදිරියේ වැඩිදුරටත් යම් සාක්ෂි මෙහෙයවීමක් හෝ සැළකිරීම් ආදියක් සිදු කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා දෙපාර්ශයට ම අවස්ථාව ලබා දෙන ලදී. දෙපාර්ශවය ම කියා සිටියේ වැඩිදුරටත් එකතු කිරීමට යමක් තමන්ට නොමැති බවයි.

පළමුවන පාර්ශ්වය වෙනුවෙන් A1 සිට A14 දක්වාත්, දෙවන පාර්ශ්වය වෙනුවෙන් R1 සිට R10 දක්වාත් ලේඛන පරීක්ෂණ විභාගයේ දී ලකුණු කොට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව කාර්ය සටහන් වල වාර්තා ගත කරනු ලැබූ සාක්ෂි හා දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත සැලකිරීම් සියල්ල ඉතා සැලකිල්ලෙන් අධ්‍යයනය කොට මෙම ප්‍රදානය පිරිනමමි.

### පෙනී සිටීම

බේරුම්කරු ඩබ්ලිව්. ජී. ඩීන් මහතා ඉදිරියේ පරීක්ෂණයේ දී පළමුවන පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු සිසිර ද සිල්වා මහතා ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ පරිපාලන නිලධාරී පී. ඩී. රමනී ඉන්ද්‍රාණී මහත්මිය ද සාක්ෂි මෙහෙයවීම පිණිස කැඳවනු ලැබ ඇත.

බේරුම්කරු ඩබ්ලිව්. ජී. ඩීන් මහතා සහ මා විසින් පරීක්ෂණය මෙහෙයවන සෑම දිනක දී ම මෙහි සහනය පතන සිසිර ද සිල්වා මහතා පරීක්ෂණයට සහභාගි විය. බේරුම්කරු ඩබ්ලිව්. ජී. ඩීන් මහතා පරීක්ෂණය මෙහෙයවන සෑම දිනක දී ම

පළමුවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ දීප්ති ගුරුගේ මහතා පෙනී සිට ඇත. 2013.10.01 දින සිට 2014.05.29 දින දක්වා දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් එහි පාලන සහකාර එස්. පී. රංජිත් මහතා සහභාගි වී ඇති අතර නීති නිලධාරිනි ප්‍රසංගා අයිලප්පෙරුම මහත්මිය පෙනී සිට ඇත. 2014.06.30 දින සිට 2014.08.21 දින දක්වා ආයතනයේ පරිපාලන නිලධාරි පී. ඩී. රමණි ඉන්ද්‍රාණි මහත්මිය සහභාගී වී ඇති අතර නීතිඥ අයේෂා කොලොන්නේ මහත්මිය පෙනී සිට ඇත. මා විසින් පරීක්ෂණය මෙහෙයවන ලද 2016.05.30 දිනයේ දී පළමු වන පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු සිසිර ද සිල්වා මහතා පරීක්ෂණයට සහභාගී වූ අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ අයේෂා කොලොන්නේ මහත්මිය පෙනී සිටියේ ය.

**පළමු වන පාර්ශ්වයේ ස්ථාවරය :**

අවුරුදු හැට දක්වා සේවය දීර්ඝ නොකොට, වයස අවුරුදු 58කුත් මාස 07කුත් දින 11ක් සම්පූර්ණ වූ 2011.05.28 වැනි දින විශ්‍රාම ගැන්වීමෙන් ඉල්ලුම්කරුට මාස 17ක කාලයක් සේවය කිරීමට තිබුණු අවස්ථාව ආයතනයේ පාලනාධිකාරිය විසින් අහිමි කරන ලද බව.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවකයන්ට සාමාන්‍ය පුරුද්දක් වශයෙන් අවුරුදු හැටක් දක්වා සේවය කිරීමට ඉඩ ලැබුණත් තමා අවුරුදු හැටේ කඩඉමට ළඟ වීමට මාස 17කට පෙර සේවයෙන් විශ්‍රාම ගැන්වීම නිසා අසමාන ලෙස සලකා තමාට අසාධාරණයක් සිදු කළ බව.

අංක 52 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ කරුණු තමාට අවාසියක් ගෙන දෙන ලෙස අර්ථකථනය කොට යොදා ගත් බව සහ තමාට සේවා දිගුව ලබා නොදීමට කිසිදු සාධාරණ පදනමක් නොතිබුණු බව.

**දෙවන පාර්ශ්වයේ ස්ථාවරය :**

ආයතනයේ පත්කිරීම් ආදී සේවක පරිපාලනය පිළිබඳ සියලු තීරණ ගැනීමේ පරම අයිතිය ඇත්තේ පත්කිරීමේ බලධාරියා වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු ව බව.

සිසිර ද සිල්වා මහතාගේ සේවය 2018.05.28 දිනෙන් ඔබ්බට දීර්ඝ නොකර විශ්‍රාම ගන්වන ලද්දේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් නිසා බව.

එම තීරණයට අධ්‍යක්ෂ මණ්ඩලය එළඹුණේ 2008.11.25 දින මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය චක්‍ර ලේඛ අංක 52ට අනුකූලව බව.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරෙන අභිමතානුසාරී බලය එම චක්‍රලේඛයේ දෙවනි ඡේදයේ " ...... අතිවිශේෂ අවස්ථාවන්හිදී කළ හැකිය." යනුවෙන් ඇති විධිවිධානය ප්‍රකාරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සිසිර ද සිල්වා මහතා විශ්‍රාම ගැන්වීම පිළිබඳ තීරණය ගනු ලැබූ බව.

ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බලය අන් අයුරකින් ප්‍රශ්න කිරීමකට භාජනය කළ නොහැකි එකක් බව.

එසේ තිබියදීත් සිසිර මහතාට වයස අවුරුදු පනස් හත ඉක්මවා පනස් අට දක්වාත් සේවා දිගුවක් ලබා දී ඇති බව.

ඒ නිසා අවුරුදු පනස් අට ඉක්මවීමෙන් පසුව ද සේවා දිගුවක් ලබා නොදීමෙන් ඔහුට අසාධාරණයක් සිදු කොට නැති බව.

**නිරීක්ෂණ සහ නිගමන**

සිසිර ද සිල්වා මහතා 1984.12.03 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තුන්වන ශ්‍රේණියේ මුදල් භාරකරු තනතුරකට පත් කරනු ලැබ. 2007.11.17 වන දින වයස අවුරුදු 55ක් සම්පූර්ණ කොට ඇත. ඉන්පසුව 2007.10.17 දින සිට 2008.10.17 දක්වා අවුරුදු 56 වන තෙක් පළමු සේවා දිගුව ද, 2008.10.17 සිට 2009.10.17 දක්වා අවුරුදු 57 වන තෙක් දෙවන සේවා දිගුව ද, 2009.10.17 සිට 2010.10.17 දක්වා අවුරුදු 58 වන තෙක් තුන්වන සේවා දිගුව ද සිසිර ද සිල්වා මහතාට ලබා දී ඇත.

අනතුරුව A1 ලෙස ලකුණු කළ ලේඛනය මඟින් ඔහුගේ වයස අවුරුදු පනස් අට සම්පූර්ණ වන 2010.10.17 දින සිට 2011.10.17 දින දක්වා තවත් වසරකින් සේවා කාලය දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද බවත්, ඒ අනුව විශ්‍රාම ගැන්වීමේ දිනය 2011.10.17 දක්වා කල් දමන බවත් එම ලිපියෙන් දැනුම් දී ඇත. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට එහි ලේකම් ජනරාල් (පරිපාලන) අත්සන් කළ 2010.09.30 දිනැති ලිපියෙන් සිසිර මහතාට ඒ බව දන්වා තිබුණි.

එහෙත් පළමුවන පාර්ශ්වය විසින් A2 ලෙස ලකුණු කළ ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් 2010.10.21 දින නිකුත් කළ ලිපියකින් සිසිර මහතාට දන්වා තිබුණේ ඉහත සඳහන් කළ 2010.09.30 දිනැති ලිපිය අවලංගු කරන ලද බවත්, අවුරුදු 58න් ඔබ්බට ඔහුගේ සේවා දිගු ලබා දීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැති බවත් ය. එසේ වුවත් විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට හැකි වන සේ විශ්‍රාම ගැන්වීමේ දිනය 2011.02.28 වැනි දින දක්වා දීර්ඝ කරන ලද බවත්ය.

ඉන්පසුව A3 ලෙස ලකුණු කළ ලිපිය මඟින් එකී අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් 2011.02.14 දින නිකුත් කළ ලිපියක් මඟින් සිසිර මහතාට දන්වා තිබුණේ ඔහුගේ විශ්‍රාම ගැන්වීමේ දිනය 2011.02.28 දිනයේ සිට එනම් 2011.05.28 දක්වා මාස තුනකින් ඉදිරියට දීර්ඝ කරන ලද බවයි.

මේ ක්‍රියාවලිය තුළින් 2010.10.17 දින සිසිර මහතාගේ වයස අවුරුදු පනස් අටක් සම්පූර්ණ වීමෙන් පසු ව තවත් මාස හතකුත් දින එකොළහක් දීර්ඝ කර ඇති බවයි. ඉහතින් සඳහන් කළ A2 ලෙස ලකුණු කළ ලිපියෙන් අධ්‍යක්ෂ මණ්ඩලය අවුරුදු 58න් ඔබ්බට ඔහුගේ සේවා දීර්ඝය කිරීම අනුමත කර නොමැති නම් තවත් මාස 07කුත් දින 11ක් ඔහු සේවයේ රඳවා ගනු ලැබුවේ කෙසේ ද යන්න පිළිබඳ ව ගැටළුවක් පැන නගී. එසේ ම ඊට අදාළ කිසිදු සඳහනක් කාර්ය සටහන්වල දකින්නට නැත.

සිසිර ද සිල්වා මහතා මුහුණ දුන් කාර්මික ආරවුල වන්නේ වයස හැට සම්පූර්ණ වීමෙන් විශ්‍රාම යාමේ සාධාරණ අවස්ථාවක් තිබිය යුතු වුවත් තමා 2011.05.28 වන දින විශ්‍රාම ගැන්වීම නිසා මාස 16කුත් දින 19ක (ඔහු කියන ආකාරයට මාස 17ක) මුල්‍යමය වශයෙන් වැටුප් පාඩුවක් සිදු වීම ය.

මෙහිදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එකී තීරණයට පදනම් කර ගත් අංක 52 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ (A5) සඳහන් වන්නේ "යම් සේවකයකුගේ සේවය අත්‍යවශ්‍ය බව පාලක මණ්ඩලය අදහස් කරන්නේ නම්..." යනුවෙනි. මෙහි දී පාලක මණ්ඩලය වශයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට සේවකයෙකුගේ විශ්‍රාම ගන්වන දිනය අවුරුදු 57න් ඔබ්බට දීර්ඝ කිරීමේ බාධාවක් ඇති නොවේ. මේ පිළිබඳ ව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පාවිච්චි කර ඇති ආකාරය පිළිබඳ ව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

සිසිර මහතා හැර වෙනත් කිසිම සේවකයෙකු අවුරුදු හැටක් ඉක්මවීමට පෙර විශ්‍රාම ගන්වනු ලැබූ බවට සාක්ෂි ඉදිරිපත් වුණේ නැත. (2014.04.07 දින කාර්ය සටහන් පිටු අංක 8) ඉල්ලුම්කරු සිසිර මහතාගේ මූලික සාක්ෂියේදී ඔහු ඒ බව සඳහන් කර ඇති අතර දෙවැනි පාර්ශවයෙන් එය බිඳ හෙළීමකට ලක්ව නැත.

A7, A8, A9, A10 යන ලේඛන ලකුණු කරමින් 2010 ජූලි සිට 2011 ජුනි දක්වා වූ අදාල කාලය තුල දී ම එල්. රංජනී, ඒ. එච්. ධර්මසේන, පී. එම්. ගමගේ, වී. සී. සිරිගම්පොල යන සේවකයින්ට අවුරුදු හැට දක්වා වූ සේවා දිගු ලබාදීම් වලට අදාලව ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඉන් පෙනී යන්නේ අවුරුදු පනස් හතෙන් ඔබ්බට සේවා දිගුවක් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රශ්න කළ නොහැකි පිළිවෙතක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුගමනය කර නොමැති බවයි.

සාමාන්‍යයෙන් සේවකයෙකුගේ සේවා දීර්ඝයක් සඳහා සලකා බැලීමේ දී ආයතනයක පාලන අධිකාරියක් මිනුම් දඬු ලෙස උපයෝගී කර ගන්නේ එකී නිලධාරියාට එරෙහි ව ඇති විනය චෝදනා, කාර්යක්ෂමතාව පිළිබඳ ගැටළු, කායික මානසික යෝග්‍යතාව පිළිබඳ කරුණු ය. සිසිර මහතාගේ සේවා දිගුව ලබා නොදීම සම්බන්ධයෙන් කිසි ම හේතුවක් දක්වා නොමැති අතර එවැන්නක් ගැන සඳහනක් බේරුම්කරණ විභාගයේ දී ද සිදු කෙරී නැත. ඔහුට විරුද්ධ එවැනි යම් කාරණයක් තිබුණේ නම් දෙවන පාර්ශවය මෙම බේරුම්කරණ විභාගයේ දී එය ඉස්මතු කරනු නොඅනුමානය ය.

මෙහි දී සඳහන් කරන ලද වී. සී. සිරිගම්පොල මහතා ද සිසිර මහතා මෙන් ම මුදල් භාරකරුවෙකු ලෙස (විශේෂ ශ්‍රේණිය) සේවය කළ කෙනෙකි. ඔහුගේ සේවය අවුරුදු හැටක් දක්වා දීර්ඝ කරනු ලැබ 2011.04.05 වන දින සේවයෙන් විශ්‍රාම ගන්වා ඇත. (A10 ලේඛනය). සමාන තනතුරක් දැරූ සිරිගම්පොල මහතාගේ සේවය ආයතනයට යම් සේ අත්‍යවශ්‍ය වී නම් තමා විශ්‍රාම යාමෙන් පසු ව තවත් වසරක් සේවයේ යෙදීමට සිසිර මහතාට ද සාධාරණ අපේක්ෂාවක් තිබෙන්නට ඇත. සේවයේ අත්‍යවශ්‍යතාව මිනුම් දණ්ඩක් ලෙස ගනු ලැබුවේ නම් සහ සිසිර මහතාගේ සේවය අත්‍යවශ්‍ය එකක් නොවේ නම් ඔහු විශ්‍රාම ගැන්වීමෙන් පසු පුරප්පාඩු වූ තනතුරට වැලිකන්දේ සිටි තුන් වන ශ්‍රේණියේ මුදල් භාරකරුවෙකු පත් කිරීමෙන් එම තනතුරෙහි කටයුතු ආවරණය කිරීම ගැටළුවකි. (2014.05.29 දින කා. ස. පිටු අංක 13)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.10.17 දින සිට 2011.10.17 දින දක්වා එක් අවුරුද්දක කාලයකට සිසිර මහතාගේ සේවය දීර්ඝ කොට ඒ බව ඔහු වෙත A1 ලෙස ලකුණු කළ ලේඛනය මගින් දැනුම් දී තිබිය දි, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ඒ සඳහා නොලැබුණේ යයි A2 ලෙස ලකුණු කළ ලේඛනය මගින් අවලංගු කිරීම සිදු වුණේ කවර පදනමක් මත ද යන්න ගැටළුවකි.

දෙවන පාර්ශවය විසින්ම R7 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (පී/ පා) වැ.බ. විධායක අධක්ෂ (ප./මු) පී. කේ. එස්. සුභෝදිනී මහත්මියගේ අත්සනින් ඉදිරිපත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සැළකිල්ලට ගැනීමේ දී සිසිර මහතාට යම් අසාධාරණයක් සිදු වූ බවට ආයතයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පවා පිළිගෙන ඇති බව පෙනී යයි.

ඉහත කරුණු අනුව නිගමනය කළ හැක්කේ සිසිර ද සිල්වා මහතාට වයස අවුරුදු හැට දක්වා සේවා දිගුවක් නොදීමෙන් මාස 16කුත් දින 19ක පාඩුවක් සිදු වීමෙන් අසාධාරණයක් සිදු වී ඇති බවය.

### ප්‍රදානය

1. ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියේ මුදල් භාරකරු (විශේෂ ශ්‍රේණියේ) නිලධාරියෙකු ව සිටි සිසිර ද සිල්වා මහතාට, ඔහු අවසන් වශයෙන් ලබමින් සිටි මාසික වැටුප රු. 29,434.25 (A14 ලෙස ලකුණු කළ 2011 මාර්තු මාසයේ වැටුප් ලේඛනය අනුව) ලෙස සලකා මාස 16යි දින 19ක් සඳහා ගණනය කරනු ලබන රු. 489,589.69ක මුදලක් ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය විසින් ගෙවිය යුතුය.

2. එකී මුදල මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මසක් ඇතුලක මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2019 දෙසැම්බර් මස 03 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

02-155

---

*මගේ අංකය* : IR/COM/04/2017/139

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.07.05 දිනැති හා අංක 2130/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.07.01 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පිලියන්දල, කැස්බෑව, ඉසුරුපුර, නො. 14/3 හි පදිංචි එල්. පී. ජයසුන්දර මයා සහ රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 03හි පිහිටි ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන කිරීමේ සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල

බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.12.03 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේදී ය.

එල්. පී. ජයසුන්දර මයා,
නො. 14/3, ඉසුරුපුර,
කැස්බෑව,
පිළියන්දල.

*යොමු අංකය* : IR/COM/04/2017/139
*නඩු අංකය* : A/69/2019

*(පළමු පාර්ශවය)*

සහ

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ
සංවර්ධනය කිරීමේ සංස්ථාව,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

*(දෙවන පාර්ශවය)*

අතර පවත්නා කාර්මික ආරවුල.

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2019.07.01 දින නො. 242, ශ්‍රී සෝභිත මාවත, නාගොඩ, කළුතර හි පදිංචි ඕබඩගේ ලීලාරත්න වන මා පත්කොට මා වෙත යොමුකොට ඇත.

එකී කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්ගේ යොමුව පහත පරිදි වේ.

"ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සේවය කළ එල්. පී. ජයසුන්දර මහතාට,

01. 1993.10.07 දින සිට ලබා දී ඇති ලිපිකරු විශේෂ ශ්‍රේණිය තනතුරට අදාල හිඟ වැටුප් 1993.10.07 දින සිට 1996.05.06 දින දක්වා නොගෙවීම.

02. නියමිත රාජකාරිවලට අමතරව ඉටු කරන ලද ණය එකතු කිරීමේ රාජකාරි කටයුතු වෙනුවෙන් දීමනාවක් ලබා නොදීම.

03. 2016.01.01 දින ජ්‍යෙෂ්ඨ පාලන නිලධාරී තනතුරට උසස් කිරීමේදී වැටුප් පරිවර්තනය නිසියාකාරව සිදු නොකිරීම.

04. 2014.10.20 දින සිට යන්ත්‍රෝපකරණ අංශයේ කළමනාකරු (පාලන) තනතුරේ රාජකාරී ඉටු කළද, එම තනතුර ලබා නොදීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද? එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමිවිය යුතු සහනයක් මොනවාද යන්න පිළිබඳව වේ."

මෙම ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශවයේ පළමු ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස කාර්මික ආරවුල් පනතේ නියෝග සංග්‍රහයේ 21 (1) දරන නියෝගය ප්‍රකාරව 2019.07.24 දිනැති නියෝගය මඟින් දන්වා ඇති අතර, ඊට ප්‍රතිචාර වශයෙන් පළමු පාර්ශ්වය වන සේවකයා විසින් 2019.08.05 දාතමින් සිය විස්තර ප්‍රකාශය ඉදිරිපත් කර ඇති අතර දෙවන පාර්ශවය වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සිය විස්තර ප්‍රකාශය 2019.08.05 දාතමින් යුතුව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී වෙත යොමුකර ඇත.

ඉන් අනතුරුව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී විසින් 2019.09.11 දින දරන ලිපිය මඟින් කාර්මික ආරවුල් පනතේ නියෝග සංග්‍රහයේ 21 (2) වගන්තිය යටතේ පිළිතුරු ප්‍රකාශ ගොනු කරන ලෙසට දැන්වීමෙන් අනතුරුව පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කරු විසින් සිය පිළිතුරු ප්‍රකාශය 2019.09.23 දාතමින් ඉදිරිපත්කර ඇති අතර දෙවන පාර්ශ්වය විසින් සිය පිළිතුරු ප්‍රකාශය 2019.10.14 දිනෙන් යුතුව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී වෙත යොමු කර ඇත.

ඉහත පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කරුගේ පළමු හා දෙවන ප්‍රකාශවලින් සිය ස්ථාවරය දක්වමින් තමන් හට 1993.10.07 දින සිට 1996.05.06 දක්වා ලිපිකරු විශේෂ ශ්‍රේණිය ලබා දීමේදී ලබා නොදුන් හිඟ වැටුප් ලබා දෙන ලෙසටත්, නියමිත රාජකාරිවලට අමතරව ඉටු කරනු ලැබූ ණය එකතු කිරීමේ රාජකාරි කටයුතු වෙනුවෙන් දීමනාවක් ලබා නොදුන් බවත්, තමන්ට යතුරු පැදිය භාවිතය සඳහා සැතපුම් කුලිය පමණක් ගෙවූ බවත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් රු. 750.00ක මාසික දීමනාවක් ගෙවන ලෙසට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යන්ත්‍රෝපකරණ) විසින් එම දීමනාව 2005 මාර්තු මස සිට ගෙවන ලෙසට නිර්දේශ කර තිබියදීත් එම දීමනාව නොගෙවූ බව පවසා සිටින අතර, 1996 සිට 1999 දක්වා තමන්ට රු. 1,000.00ක දීමනාවක් ගෙවූ බවද එබැවින් තමාට හිඟ මුදල් ලබාදෙන ලෙසටද ඉල්ලා සිටී.

2006.01.01 දින සිට ජ්‍යෙෂ්ඨ පාලන නිලධාරී තනතුරට උසස් කිරීමේදී වැටුප් පරිමානය නිසියාකාරව සිදු නොකළ බවද, එනම් තමන්ගේ කලින් තනතුරේ කලින් තනතුරේ වැටුප් වර්ධක දිනය වන 2006.07.24 දින වැටුප් වර්ධකය පදනම් කරගෙන වැටුප් සකස් නොකළ බවද,

2004.10.20 වැනි දින සිට යන්ත්‍රෝපකරණ අංශයේ කළමනාකරු (පාලන) තනතුරේ රාජකාරී ඉටු කළද එම තනතුර තමන්ට ලබා නොදුන් බවටත් කරුණු දක්වා ඇත.

දෙවන පාර්ශ්වය තම පළමු හා දෙවන ප්‍රකාශ මගින් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ මෙම ඉල්ලුම්කරු ආරක්ෂක නිලධාරි 11 ශ්‍රේණියේ සිට ජ්‍යෙෂ්ඨ පාලන නිලධාරී දක්වා විවිධ තනතුරු දැරූ බවත්, ඔහුගේ ඉල්ලීම් වන ලිපිකරු විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේදී එය පෙරදාතම් කර ලබාදී ඇති බවත් එහෙත් එය ලබාදීමේදී හිඟ වැටුප් ගෙවීමකින් තොරව තනතුර ලබාදීමක් සිදු කර ඇති බවත් ඉල්ලුම්කරු ඊට එකඟව කිසිදු විරෝධතාවයක් නොදක්වා සිය පත්වීම භාරගෙන ඇති බවත්ය.

තවද, ණය එකතු කිරීමේ රාජකාරියට අදාල දීමනා ලබා ගැනීම සම්බන්ධයෙන් එවැනි ප්‍රතිපාදනයක් නොමැති බවත්,

ජ්‍යෙෂ්ඨ පාලන නිලධාරී තනතුරට උසස් කිරීම වෙනුවෙන් හිමි අමතර වැටුප් වර්ධක ලබා ගැනීම යන්න සම්බන්ධයෙන් කරුණු දක්වමින් අදාල ක්‍රියා පරිපාටියට අනුව වැටුප් පරිවර්තනය නිවැරදිව සිදු කර ඇති බවත්,

2004.10.20 දින සිට කළමනාකරු (පාලන) තනතුර සම්බන්ධයෙන් කරුණු දක්වමින් එවැනි තනතුරක් අනුමත කර නොමැති බවත් ඔහුට එකී තනතුරේ රාජකාරි අතිරේක රාජකාරි වශයෙන් පවරා ඇති බවත් පවසා සිටී.

ඒ අනුව දෙපාර්ශ්වයට කාර්මික අධිකරණයේ බේරුම්කරු ඉදිරියේ 2019.10.28 වැනි දින විභාගය සඳහා පෙනී සිටින ලෙසට 2019.10.11 දිනැති ලිපියෙන් දන්වා ඇති අතර ඒ අනුව දෙපාර්ශ්වය නියමිත දින බේරුම්කරු ඉදිරියේ පෙනී සිටින ලදී.

එදින දෙපාර්ශ්වයට යම් සමථයක් ඇත්නම් කරුණු ඉදිරිපත් කරන ලෙසට දන්වා සිටින ලදුව ඉල්ලුම්කරු විසින් සමථයක් වශයෙන් තමන්ගේ ඉල්ලීම්වලින් අංක 3 හැර අංක 1, 2 සහ 4 යන ඉල්ලීම් ලැබෙනවා නම් සමථයක් විය හැකි බව දන්වා සිටින ලදී.

ඒ අනුව සමථය සලකා බැලීම සඳහා අවසර ඉල්ලා සිටින ලද අතර, ඊළඟ නඩු වාරය 2019.11.20 දිනට දින නියම කරන ලදී.

මේ අතරතුර පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින් සිය ස්ථාවරය සම්බන්ධයෙන් කරුණු දිවුරුම් ප්‍රකාශයක් මගින් 2019 නොවැම්බර් මස 01 දාතමින් බේරුම්කරු වෙත ගොනු කර තිබූ අතර, 2019.11.20 දින නඩුව කැඳවූ අවස්ථාවේදී දෙවන පාර්ශ්වය වන සංස්ථාව විසින් මූලික විරෝධතාවයක් දක්වා සිටිමින් එම මූලික විරෝධතාවය ලිඛිත දේශන මගින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ඉල්ලා සිටින ලදුව ඒ සඳහා අවසර ලබා දෙමින් දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාවය ඊළඟ නඩු දිනයට ප්‍රථම පළමු පාර්ශ්වය වෙත ලබා දෙන ලෙසටත් දෙපාර්ශ්වය විසින්ම තම පිළිතුරු ලිඛිත දේශන 2019.11.29 දින ගොනු කරන ලෙසටත් නියෝග කරන ලදී.

ඒ අනුව මෙම නඩුව 2019.11.29 දින නොකැඳවූ අතර නැවත 2019.12.16 දිනට කැඳවන ලදී. දෙවන පාර්ශ්වය විසින් සිය ලිඛිත දේශන ගොනු කරන ලද අතර, ඊට පිළිතුරු ගොනු කිරීම සඳහා කල්වේලා ප්‍රමාණවත් නොවූයෙන් ඒ සඳහා සතියක කාලයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදුව ඊට අවසර ලබාදෙන ලදී. ඒ අනුව පළමු පාර්ශ්වය විසින් 2019 දෙසැම්බර් මස 20 වැනි දින සිය පිළිතුරු කාර්මික අධිකරණය වෙත ගොනු කරමින් පවසා ඇත්තේ තමන් පිළිතුරු ප්‍රකාශයක් ගොනු නොකරන බවයි.

ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් ගොනු කර ඇති මූලික විරෝධතාවයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන සලකා ඒ සම්බන්ධයෙන් පහත පරිදි තීරණයක් ලබා දෙමි.

දෙවන පාර්ශ්වය සිය විරෝධතාවයන් මගින් කරුණු ඉදිරිපත් කරමින් පවසා සිටින්නේ කාර්මික ආරවුල් පනතේ 19 වගන්තිය යටතේ බේරුම්කරුවකු විසින් දෙනු ලබන ප්‍රදානයක් මගින් එයට සම්බන්ධ සියළුම පාර්ශවයන් බැඳී සිටින බවත්, එම ප්‍රදානයේ නියමයන් දෙපාර්ශ්වය අතර පවත්නා සේවා ගිවිසුමේ ව්‍යංග නියමයන් ලෙස ක්‍රියාත්මක වන බවත් යන තර්කය සම්බන්ධයෙන් කිසිදු විවාදයක් නැත. මන්දයත් එය කාර්මික ආරවුල් පනතේ ඇති ප්‍රතිපාදනයක් වන බැවිනි.

තවදුරටත් කරුණු දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින්

"මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් එදිරිව ජේ. ඒ. සුමිත් ආදිහෙට්ටි හා තවත් අය SC Appeal 22/2012 දක්වා ඇති

'It is obvious that when an award is made the terms of the award becomes implied terms attached to the contract of employment, so there should be an existing contract of employment for the award to take effect at the time of making the award at the end of the arbitration. This Section presupposes the existence of a valid contract between the employer and employee.'

තීරණය අනුව කාර්මික ආරවුල් පනතේ ඇති 19 වගන්තිය සම්බන්ධ කරුණු තහවුරු කර ඇත.

මෙම කරුණු සමඟ මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධ තත්ත්වය ගැළපෙන්නේද යන්න විමසා බැලීම කළ යුතුවේ. මන්ද එසේ නොවුනහොත් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවනවා පමණක් නොව මාගේ ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත එකක් නොවීමට ඉඩකඩ ඇති බැවිනි.

මෙම කරුණු සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී මෙම ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය හා වගඋත්තරකාර දෙවන පාර්ශ්වය අතර වලංගු සේවා ගිවිසුමක් පැවතියේද යන්න පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කළ යුතුය. මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු මෙම ආයතනයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය ලබා දී ඇත්තේ 2017.02.02 දින වන අතර මෙම ඉල්ලුම්කරු 2016 පෙබරවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි වැටුප් රහිතව මධ්‍යම ඉංජිනේරු උපදේශන

කාර්යාංශය වෙත මුදාහැර ඇති අතර නැවත මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සේවයට වාර්තා කර නොමැති අතර තම ඉල්ලා අස්වීම් ලිපිය සංස්ථාවට භාරදී ඇත. ඒ අනුව මෙම ඉල්ලුම්කාර සේවකයා නැවත සේවයට වාර්තා කර නොමැති බැවින් සංස්ථා සේවයෙන් 2016.02.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිදහස් කර ඉල්ලා අස්වීම භාරගෙන ඇත.

මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු තම පළමු ප්‍රකාශයෙන් හෝ දෙවන ප්‍රකාශයෙන් කිසිදු අවස්ථාවක තම ඉල්ලීම් සම්බන්ධයෙන් ආයතනය සමඟ සිදුකරන ලද කිසිදු ඉල්ලීමක් සම්බන්ධ සාක්ෂි හෝ ලේඛන ඉදිරිපත් කර නොමැති අතර, තම 2019 නොවැම්බර් මස ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මහින්ද කිසිදු අවස්ථාවක මෙම ආරවුල සම්බන්ධයෙන් ආයතනයට හෝ වෙනත් ආයතනයක් වෙත කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කර නොමැත. මෙම ඉල්ලීම් සම්බන්ධයෙන් මොහු ප්‍රථම වතාවට සිය පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ 2017.07.15 දාතමින් "සාධාරණය ඉටු කර ගැනීම" යන ශීර්ෂ යටතේ කම්කරු හා වෘත්තීය සමිති අමාත්‍යවරයා වෙත වන අතර, නැවතත් "සාධාරණය ඉටුකර ගැනීම" යන ශීර්ෂය යටතේ කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් කාර්මික සබඳතා අංශය වෙත 2017.08.05 දාතමින් සිය පැමිණිල්ල යොමු කර ඇත. අදාල ලිපි වල සහතික පිටපත් මෙම ගොනුවේ 93 හා 95 යන පිටුවල X 12 සහ X 13 ලෙස සලකුණු කර දෙවන පාර්ශ්වය තම ලිඛිත දේශන සමඟ යා කරමින් ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කරු සංස්ථා සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දී ඇත්තේ 2017.02.02 දින වන අතර ඔහුගේ ඉල්ලා අස්වීම සංස්ථාව විසින් භාරගෙන ඇති අතර ඉල්ලුම්කරු 2016.02.03 දින සිට සංස්ථා සේවයෙන් නිදහස් කර ඉල්ලා අස්වීම භාරගෙන ඇත. ඉල්ලුම්කරු ප්‍රථම වතාවට සිය ඉල්ලීම් සම්බන්ධවන කරුණු පිළිබඳව පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත්තේ සිය ඉල්ලා අස්වීම භාරදුන් දිනයේ සිට මාස පහක පමණ කාලයකින් පසුව බව නිරීක්ෂණය විය. මෙහිදී විශේෂයෙන් සලකා බැලිය යුතු කරුණ වනුයේ මෙකී ආරවුලට සම්බන්ධව පළමුවන හා දෙවන පාර්ශ්වය අතර ඇත්ත වශයෙන්ම සජීවී ආරවුලක් පැවතුනාද යන කරුණ පිළිබඳ වේ. මන්දයත් කාර්මික ආරවුල් පනත යටතේ සජීවී ආරවුලක් (live dispute) පැවතුනා ද යන්න පිළිබඳ සොයා බැලීම ඉතා වැදගත් කරුණක් වන බැවිනි. මේ සම්බන්ධයෙන් විනිශ්චිත "S. B. Perera vs Standard Chartered Bank and Others (1995) 1 SLR 73 නඩුවේදී අමරසිංහ විනිසුරුතුමා කළ ප්‍රකාශය ඉතා වැදගත් තැනක් ගනී. එනම් එතුමාට අනුව කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ පත් කරන ලද බේරුම්කරුවකුට සේවය නතර වීමෙන් (cessation of employment) පසුව ඇතිව ආරවුලක් විභාග කිරීමට බලය නැති නමුත්, මෙම නඩුවේදී ආරවුල හටගෙන ඇත්තේ එම සේවකයා සේවයේ යෙදී සිටින අවදියේම වන බැවින් "පවත්නා කාර්මික ආරවුලක්" (live dispute) ඇති බැවින්, එම ආරවුල 4 (1) වගන්තිය යටතේ පත් කරන ලද බේරුම්කරුවකුට යොමු කිරීමේ බලය ඇමතිවරයා සතු වන බවයි. (ලංකා සේවා සම්මේලනයේ ප්‍රකාශනයක් වන කාර්මික ආරවුල් පනත හා ආශ්‍රිත නඩු තීන්දු නීතිය - ඒ. ඒ. චම්පිකා ජයසිංහ ගේ කෘතියෙහි 11 පිටුව)

AZN Grindlay's Bank vs. Minister of Labour and others (1995) 2 SLR 53 -

මෙම නඩුවේදී සේනානායක විනිසුරුතුමා ප්‍රකාශ කර ඇත්තේ කාර්මික ආරවුල් පනත යටතේ යම් කාර්මික ආරවුලක් නිරවුල් කිරීම පිණිස යොමු කළ හැකි වන්නේ සේවක - සේව්‍ය සබඳතාව පවත්නා අවස්ථාවකදී පමණක් වන බවයි. එනම් මෙම නඩුවේදී සේවකයා ඉල්ලා අස්වීමේ ලිපිය බාර දෙන අවස්ථාවේදී කාර්මික ආරවුලක් නොතිබුණි. එම නිසා එවැනි ආරවුලක් ඇමතිවරයාට කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ නිරවුල් කිරීම පිණිස යොමු කිරීමට බලයක් නොමැති බවයි. (ලංකා සේව්‍ය සම්මේලනයේ ප්‍රකාශනයක් වන කාර්මික ආරවුල් පනත හා ආශ්‍රිත නඩු තීන්දු නීතිය - ඒ. ඒ. චම්පිකා ජයසිංහ ගේ කෘතියෙහි 11 පිටුව)

ඉහත නඩු තීරණවලට අනුව පෙනී යන්නේ මෙම ඉල්ලුම්කරු විසින් සිය ආරවුල ආරම්භ කර ඇත්තේ ඔහු සේවයෙන් ඉවත්වී මාස 5ක පමණ කාලයක් ඉකම ගිය පසු බවයි. පළමු පාර්ශ්ව වන ඉල්ලුම්කරු තමා සේවයෙන් ඉවත් වීමට පෙර කිසිදු අවස්ථාවක තම ඉල්ලීම් සම්බන්ධයෙන් හඬ කළ බවට කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති බැවින් දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාවයක් වන ඉල්ලුම්කරු හා වග උත්තරකාර ආයතනය අතර දැනට බලාත්මක කිසිදු සේවා ගිවිසුමක් නොමැතිය යන තර්කය පිළිගැනීමට සිදු වන බව පැහැදිලි කරුණකි.

තවද, එකී විරෝධතා අතර සඳහන් කර ඇති මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් එදිරිව ජේ. ඒ. සුමිත් ආදිහෙට්ටි හා තවත් අය යන නඩුවේ කරුණු හා මා විසින් ඉහතින් ඉදිරිපත් කරන ලද AZN Grindlay's Bank vs. Minister of Labour and others (1995) 2 SLR 53 යන නඩුවලට අනුව මෙම බේරුම්කරණ නඩුව සම්බන්ධයෙන් ප්‍රදානයක් ලබා දීමට අධිකරණ බලය මෙම බේරුම්කරණය වෙත නොමැති බවටද ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවය පිළිගැනීමට සිදු වේ.

මීට අමතරව දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාවයක් වන පළමු පාර්ශ්වයේ ආරවුලට තුඩුදුන් කරුණු අතර පළමුවන කරුණ වන

"1993.10.07 දින සිට ලබාදී ඇති ලිපිකරු විශේෂ ශ්‍රේණිය තනතුරට අදාළ හිඟ වැටුප් 1993.10.07 දින සිට 1996.05.06 දින දක්වා නොගෙවීම යන කරුණ කාලාවරෝධවී ඇති බවට ඉදිරිපත් කරන ලද විරෝධතාවයද පහත සඳහන් කරුණු මත පිළිගැනීමට සිදුවී ඇත.

01. පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින් 2017.07.15 වැනි දිනට පෙර කිසිදු අවස්ථාවක මෙම හිඟ වැටුප් සම්බන්ධයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කළ බවට සනාථ කර නොමැත.

02. 2017.07 මාසය වන විට මෙම හිඟ මුදල නොගෙවා වසර 21කට අධික කාලයක් ගතව ඇති බැවින් ඇත්ත වශයෙන්ම මෙම කරුණ කාලාවරෝධී වී ඇති බව.

ඉහත කරුණු අනුව දෙවන පාර්ශ්වය විසින් ගෙන එන ලද එම මූලික විරෝධතාවය ද පිළිගැනීමට සිදු වේ.

මීට අමතරව දෙවන පාර්ශ්වය විසින් විරෝධතාවයන් නොදක්වා ඇති අනිකුත් කරුණු කෙරෙහි මාගේ අවධානය යොමු කරන ලද්දේ මෙම ඉල්ලුම්කරු වෙත කුමන හෝ සහනයක් ප්‍රදානය කිරීමේ ඉඩකඩක් මෙම බේරුම්කරණය තුල තිබේද යන්න සලකා බැලීම මඟින් සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් කිරීමට මා හට ඉඩ සැලසෙන බැවිනි. ඒ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර සේවකයා සම්බන්ධ යොමුවෙහි දෙවන කරුණ පහත පරිදි වේ.

"නියමිත රාජකාරිවලට අමතරව ඉටු කරන ලද ණය එකතු කිරීමේ රාජකාරි කටයුතු වෙනුවෙන් දීමනාවක් ලබා නොදීම."

මෙම කරුණ සම්බන්ධයෙන් සලකා බැලීමේදී මේ සම්බන්ධයෙන් රුපියල් හත්සිය පනහක (රු. 750.00) දීමනාවක් ගෙවන ලෙසට නිර්දේශයක් කර ඇති අතර, 1996 සිට 1999 දක්වා මසකට රුපියල් දහස (රු. 1,000.00) බැගින් දීමනාවක් ඉල්ලුම්කරුට ගෙවා ඇත. ඒ අනුව දෙවන පාර්ශ්වය මෙම මුදල් ගෙවීමට නොහැකිය කීම පිළිගත නොහැකි වන්නේ ඔවුන් මෙම මුදල් ගෙවීම තුළින් එම මුදල ගෙවීමට ඇති බවට ප්‍රතිබන්ධනය වී ඇති බැවිනි. එහෙත් මෙම ඉල්ලීමද දැනට වසර පහළවකට වඩා පැරණි වන ඉල්ලීමක් වන අතර ඒ සම්බන්ධයෙන් ද 2017.07.15 දක්වා කිසිදු ඉල්ලීමක් හෝ සිදුකළ බවට කිසිදු සාක්ෂියක් පළමු පාර්ශවය වන ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර නොමැති බැවින් මෙම ඉල්ලීමද කාලාවරෝධී වී ඇති බව මනාව පැහැදිලි වන බැවින් ඒ සම්බන්ධයෙන් ද කිසිදු සහනයක් ලබාදීමට මෙම බේරුම්කරණයට හැකියාවක් නොමැත.

මීට අමතරව පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ තුන්වැනි ඉල්ලීම වන්නේ

"2016.01.01 දින සිට ජ්‍යෙෂ්ඨ පාලන නිලධාරී තනතුරට උසස් කිරීමේදී වැටුප් පරිවර්තනය නිසියාකාරව සිදු නොකිරීම."

මේ කරුණ සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ පළමු හා දෙවන ප්‍රකාශ පරීක්ෂා කර බැලීමේදී එයද පහත කරුණු මත ප්‍රතික්ෂේප කිරීමට සිදුවී ඇති බව පැහැදිලි කරුණකි.

1. උසස් වීම ලබන්නේ 2016.01.01 දින සිට වේ.
2. ඔහුට උසස් වීමට පෙර තනතුරෙහි වැටුප් වර්ධක දිනය 2016.07.24 දින වේ.
3. ඔහු පිහිටුවා ඇති වැටුප් තලය රුපියල් දහතුන් දහස් හයසිය හැට පහ (රු. 13,665.00 කි)
4. ඔහු ඉල්ලා සිටින්නේ තමන් පෙර දැරූ තනතුරට 2016.07.24ට හිමි වැටුප් තලය වන රුපියල් දහතුන් දහස් හත්සිය හතලිහ (රු. 13,740.00)ක පිහිටුවන ලෙසයි.

මෙම ඉල්ලීමද පහත සඳහන් හේතු මත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

උසස් වීම ලැබුණු දිනය වන්නේ 2016.01.01 දින වේ. උසස් වීමක් ලද පසු වැටුප් තලයෙහි පිහිටුවනු ලබන්නේ උසස්වීම් දින වන විට ලැබුණු වැටුප පදනම් කරගෙන වේ. එහෙත් මෙම ඉල්ලුම්කරු ඉල්ලා සිටින්නේ තමන්ගේ උසස්වීමට පෙර තනතුරෙහි 2016.07.24 වැනි දිනට හිමි වන වැටුප් තලයෙහි පිහිටුවීමට වේ. මෙය කිසිසේත්ම නීත්‍යානුකූල හෝ සාධාරණ ඉල්ලීමක් නොවේ. මන්දයක් ඉදිරියට ලැබීමට ඇති වැටුප් වර්ධකයක් පදනම් කර ගනිමින් නව තනතුරකදී වැටුපක් ලබා දීමට කිසිදු නෛතික ප්‍රතිපාදනයක් නොමැති බැවිනි. එබැවින් එම ඉල්ලීම ද ප්‍රතික්ෂේප කරමි.

මෙම ඉල්ලුම්කරුගේ අවසාන ඉල්ලීම වනුයේ

"2014.10.20 දින සිට යන්ත්‍රෝපකරණ අංශයේ කළමනාකරු (පාලන) තනතුරේ රාජකාරි ඉටු කළද එම තනතුර ලබා නොදීම."

ආයතනයක යම් තනතුරක රාජකාරි ඉටු කළ පමණින් එම තනතුරේ ස්ථිර කිරීමට හැකියාවක් ආයතනයට නොමැත. තනතුරක රාජකාරි ඉටු කිරීම හුදෙක් රාජකාරියක් ආවරණය කිරීම පමණක් වේ. එබැවින් මෙම ඉල්ලීම ද සලකා බැලිය හැකි ඉල්ලීමක් නොවන බැවින් එම ඉල්ලීම ද ප්‍රතික්ෂේප කරමි.

**ප්‍රදානය**

ඉහත කරුණු අනුව දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතාවයක් අදාල නඩු තීරණ සමඟ සලකා බලා මෙම ආරවුල සම්බන්ධයෙන් ප්‍රදානයක් කිරීමට මෙම බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බැව් තීරණය කරමි.

ඒ අනුව මෙම ආරවුල සම්බන්ධයෙන් ප්‍රදානයක් නොකරමි.

මෙම ප්‍රදානය සාධාරණවූත්, යුක්ති සහගත වූත් ප්‍රදානයක් බවට තීරණය කරමි.

ඕබඩගේ ලීලාරත්න,
බේරුම්කරු,

2019 දෙසැම්බර් මස 30 වන දින දීය.

02-156

---

*මගේ අංකය :* IR/21/52/2013

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.11.29 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා කොළඹ 10, ආනන්ද රාජකරුණා මාවත, අංක 141 හි පිහිටි නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, සහ බියගම, බියගම අපනයන සැකසුම් කලාපය හි පිහිටි ඇන්සල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3529 දරන ප්‍රදානය 2019.01.23 දිනැති හා අංක 2107/31 දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.*

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2020.01.06 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18 (1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශය පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ 05 කම්කරු දෙපාර්තමේන්තුවේ 9 වෙනි මහලේ පිහිටි බේරුම්කරණයේදීය.

*යොමු අංකය ː* IR/21/52/2013

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා,
සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

*ඉල්ලුම්කාර පාර්ශ්වය (1 වන පාර්ශ්වය)*

*නඩු අංකය ː ඒ/* 3529

සහ

ඇන්සල් ලංකා පුද්ගලික සමාගම.
බියගම අපනයන සැකසුම් කලාපය.
බියගම.

*වගඋත්තරකාර පාර්ශ්වය (2 වන පාර්ශ්වය)*

වර්ෂ 2020 ක්වූ ජනවාරි මස 06 වෙන දින දීය.

ඉහත ආරවුලට අදාලව මා විසින් 2018 නොවැම්බර් මස 29 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදානය සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය විසින් අර්ථ නිරූපනයක් ඉල්ලා ඇති අතර ඒ අනුව අර්ථ නිරූපනයක් ලබාදීම මා වෙත පැවරී ඇති කාර්යයක් වන බවට තහවුරු වී ඇති බැවින්, මා විසින් ඉහත ආරවුලට අදාලව පැවැති විභාගයෙන් අනතුරුව ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදානය සම්බන්ධයෙන් වැඩි දුරටත් අර්ථ නිරූපනය කරමින් පහත සඳහන් කරුණු ප්‍රකාශ කර සිටිමි."

මෙම මුල් ප්‍රදානය ලබා දීම සඳහා මා විසින් සැළකිල්ලට ගන්නා ලද නඩුවේ ඉදිරිපත් වූ සියළුම කරුණු සහ තීන්දුවට හේතුන් මාගේ මුල් ප්‍රදානයේ මා විසින් පැහැදිළිව සඳහන් කර ඇත. එහි පිටපතක් ද ඔබගේ දැනගැනීම සඳහා අමුණා ඇත.

එම ප්‍රදානය ලබාදීමේදී අවසාන වශයෙන් මා විසින් සඳහන් කර ඇත්තේ මෙම බේරුම්කරණ නඩුවට අදාල සේවකයින් 11 දෙනාගේ සේවය වගඋත්තරකරු විසින් අසාධාරණව අවසන් කර ඇති බව මා විසින් ඉදිරිපත් වූ සාක්ෂි මත තීරණය කර ඇති බවත්, ඒ අනුව ඔවුන්ට ප්‍රදානයක් ලෙස සේවය අහිමිව සිටි කාලයට හිමි බෝනස් ඇතුළු සියළු දීමනාවක් ගෙවිය යුතු බවත් ය.

එකී ප්‍රදානය දීමේ දී මා විසින් පැහැදිළි නොකරන ලද පහත සඳහන් කරුණු ද එකී ප්‍රදානය ඇතුලත් විය යුතු බවට මා විසින් අර්ථ නිරූපනයක් ලෙස ප්‍රකාශ කර සිටිමි.

මෙම බේරුම්කරණය අදාල සේවක පිරිසගේ සේවය වගඋත්තරකරු විසින් අවසන් කිරීම, ඔවුන්ගේ වෘත්තීය සමිති ක්‍රියාකාරකම් හේතුකොටගෙන, පළිගැනීමේ ක්‍රියාවක් වශයෙන් සිදුකර ඇති බවට සාක්ෂි මගින් පැහැදිලි වී ඇත. එසේම සාමාන්‍ය යුක්ති ධර්මයට අනුව ඔවුන්ගේ සේවය අවසන් කිරීමට යොදාගනු ලැබූ චෝදනා සම්බන්ධයෙන් නිදහසට කරුණු ඉදිරිපත් කිරීමටත් ඔවුන්ට ප්‍රමාණවත් අවස්ථාවක් ලබාදී නොමැත. එසේම මෙම බේරුම්කරණයට අදාල සේවකයින්ගෙන් සමහර දෙනෙකු කුමන හෝ ක්‍රියාකාරකමක යෙදුන බවට කිසිදු සඳහන් කිරීමක් හෝ වගඋත්තරකරු විසින් කර නොමැති අතර, කිසිදු සොයා බැලීමකින් තොරව මෙම සේවකයින් වෘත්තීය සමිති සාමාජිකයින් වීම පමණක් අදාල කරගෙන ඔවුන්ගේ සේවය වගඋත්තරකරු අවසන් කර ඇති බව හොඳින් තහවුරු වන අතර එය අසාධාරණ සහ අයුක්ති සහගත සේවය අවසන් කිරීමක් බව පැහැදිළි ය. ඒ අනුව සුදුසුම ප්‍රදානය වන්නේ ඔවුන් හිඟ වැටුප්, සියළු දීමනා සහ වරප්‍රසාද සහිතව නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමට නියෝග කිරීම වුවත්, මෙම සේවකයින් සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් ක්‍රියාකර ඇති ආකාරය අනුව ඇතිවී තිබෙන වාතාවරණය මත ඔවුන් නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම කාර්මික සාමයට බාධාවක් බවට පැහැදිළි ය.

එසේ හෙයින්,

මෙම බේරුම්කරණයට අදාල සේවකයින් 11 දෙනාගේ සේවය වගඋත්තරකරු විසින් අවසන් කළ දින සිට, ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනය හෝ මෙම ප්‍රදානයේ දිනය යන දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා වන හිඟ වැටුප්, සියළු දීමනා සහ වරප්‍රසාද ඔවුන්ට ලබාදිය යුතු බවට මාගේ මුල් ප්‍රදානයට ඇතුලත් විය යුතු බවට තීරණය කරමි.

ඒ අනුව එක් එක් සේවකයා සම්බන්ධයෙන් එක් එක් සේවකයාට ඔවුන්ගේ නම් ඉදිරියේ සඳහන් හිඟ වැටුප් සහ ප්‍රසාද දීමනාව ලබා දීමට නියෝග කරමි.

| | | | |
|---|---|---|---|
| 01. කේ. ඒ. ඩී. අතුල කමල් කළුආරච්චි | - | හිඟ වැටුප් ප්‍රමාණය | 2,291,488.00 |
| | | ප්‍රසාද දීමනාව | 413,337.75 |
| | | එකතුව | 2,704,825.75 |
| 02. එස්. කනපති | - | හිඟ වැටුප් ප්‍රමාණය | 2,429,115.00 |
| | | ප්‍රසාද දීමනාව | 436,948.75 |
| | | එකතුව | 2,866,063.75 |

| | | | |
|---|---|---|---|
| 03. කේ. කේ. ඒ. ඩී. විපුල කලුආරච්චි - | හිග වැටුප් ප්‍රමාණය | 2,279,912.00 |
| | ප්‍රසාද දීමනාව | 411,251.75 |
| | එකතුව | 2,691,163.75 |
| 04. ජේ. ඒ. කමල් ජයතිස්ස - | හිග වැටුප් ප්‍රමාණය | 2,614,364.00 |
| | ප්‍රසාද දීමනාව | 471,576.00 |
| | එකතුව | 3,085,940.00 |
| 05. ඩබ්. ඩී. දසන්ත ජයලත් - | හිග වැටුප් ප්‍රමාණය | 2,614,364.00 |
| | ප්‍රසාද දීමනාව | 471,576.00 |
| | එකතුව | 3,085,940.00 |
| 06. යූ. ඒ. චන්දන රොෂාන් - | හිග වැටුප් ප්‍රමාණය | 2,432,731.00 |
| | ප්‍රසාද දීමනාව | 439,041.75 |
| | එකතුව | 2,871,772.75 |
| 07. මුදලිගේ ශාන්ත කුමාර් - | හිග වැටුප් ප්‍රමාණය | 2,432,731.00 |
| | ප්‍රසාද දීමනාව | 439,041.75 |
| | එකතුව | 2,871,772.75 |
| 08. ඒ. එල්. එම්. නසාර් - | හිග වැටුප් ප්‍රමාණය | 2,432,731.00 |
| | ප්‍රසාද දීමනාව | 439,041.75 |
| | එකතුව | 2,871,772.75 |
| 09. ජී. ඒ. එල්. අජිත් ප්‍රියන්ත - | හිග වැටුප් ප්‍රමාණය | 2,432,731.00 |
| | ප්‍රසාද දීමනාව | 439,041.75 |
| | එකතුව | 2,871,772.75 |
| 10. ජේ. එන්. ජේ. බී. පී. කේ. ජයවික්‍රම - | හිග වැටුප් ප්‍රමාණය | 2,432,731.00 |
| | ප්‍රසාද දීමනාව | 439,041.75 |
| | එකතුව | 2,871,772.75 |
| 11. ඩී. ජේ. රෝහිත ද සිල්වා - | හිග වැටුප් ප්‍රමාණය | 3,520,220.00 |
| | ප්‍රසාද දීමනාව | 634,961.25 |
| | එකතුව | 4,155,181.25 |

මේ අනුව මෙම බේරුම්කරණයට අදාල එක එක් සේවකයාට මෙම ප්‍රදානය පරිදි ලැබිය යුතු ප්‍රදානයන්ට අදාල මෙම ගෙවීම් වෙන වෙනම, මෙම අර්ථ නිරූපනය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට මසක් ඇතුලත කම්කරු දෙපාර්තමේන්තුවේ මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළයුතු බවටත් මම නියෝග කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බවට මම ප්‍රකාශ කරමි.

ටී. පියසෝම
(බේරුම්කරු)

නාරාහේන්පිට කම්කරු මහලේකම් කාර්යාලයේදී ය.

02-157

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.